# රාහුල විද්‍යාලය - මාතර

## පළමු වාර පරීක්ෂණය - 2011

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

**12 ශ්‍රේණිය** **කාලය : පැය 3**

**කෙටි ප්‍රශ්න 20 ක් ඇතුළුව දෙවනි කොටසින් ප්‍රශ්න 03 ක් තෝරා පිළිතුරු සපයන්න.**

1) සන්නිවේදනය හඳුනා ගැනීමේ දී ඒ පිළිබඳ නිවැරදි වරණය වන්නේ
   i. මධ්‍යතන යුගයේදී ආරම්භ වී වර්ධනය විය.
   ii. ක්‍රිපූ. 3000 දී ආරම්භ වී විකාශය විය.
   iii. මානවයා සිතන්නට පටන් ගත්දා සිට ආරම්භ වී ඇත.
   iv. මානව අවශ්‍යතා සංකීර්ණ වූ අවධියේ ආරම්භ වී ඇත.
   v. වැඩවසම් සමාජ අවධියේ වර්ධනය විය.

2) පුද්ගලයන් දෙදෙනෙකු අතර එක සමාන මනෝ වෘත්තියක් ඇති කරලීම සන්නිවේදනය බව ප්‍රකාශ කරන ලද්දේ
   i. එඩ්වඩ් සැපියර් විසිනි. ii. විල්බර් ශ්‍රාම් විසිනි.
   iii. ඩේවිඩ් කේ බර්ලෝ විසිනි. iv. ප්‍රැන්ඩ් ඊ ෆෙක්ස් විසිනි.
   v. සැනන් වීවර් විසිනි.

3) සන්නිවේදනය හඳුනා ගැනීමේදී අත්‍යවශ්‍යයෙන්ම පැවතිය යුතු මූලිකාංග වන්නේ
   i. සන්නිවේදක මාධ්‍ය හා සංදේශය ii. සන්නිවේදක සංදේශය හා ග්‍රාහකයා
   iii. මූලාශ්‍ර ආකේතය හා විකේතය iv. ආකේතය විකේතය හා ප්‍රතිපෝෂකය
   v. සන්නිවේදක බාධක හා ග්‍රාහකයා

4) සන්නිවේදනය සම්බන්ධයෙන් වඩාත් නිදොස් ප්‍රකාශය වන්නේ
   i. සන්නිවේදන ක්‍රියාවලියේ සන්නිවේදක හා ග්‍රාහක භූමිකා ස්ථාවරව පවතී.
   ii. සන්නිවේදනය යනු හුදෙක් සංකේත හුවමාරුවක් නොවේ.
   iii. ග්‍රාහකයෙකු නොමැති වුවද සන්නිවේදනය සිදුවේ.
   iv. සන්නිවේදන ක්‍රියාවලියේ දී සියලු පනිවිඩ තොරතුරු සම්පාදනය කරයි.
   v. සන්නිවේදනය තුළ බලපෑම නිශේධනය වේ.

5) සැනෝන් වීවර් ගණිතමය ආකෘතිය වඩාත් අවධානය යොමුකර ඇත්තේ
   i. බලපෑම සම්බන්ධයෙනි. ii. ශබ්ද මූලයන්ගෙන් සෝෂා සම්බන්ධයෙනි.
   iii. ප්‍රතිපෝෂණ සම්බන්දයෙනි. iv. ප්‍රතිචාර සම්බන්ධයෙනි.
   v. ආකේතකරණය සම්බන්ධයෙනි.

6) අම්බලමේ සන්නිවේදනය වඩාත් අර්ථවත් වන්නේ
   i. ජන සන්නිවේදනය සඳහාය ii. අවිධිමත් සන්නිවේධනය සඳහාය.
   iii. සමූහ සන්නිවේදනය සඳහාය iv. අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහාය
   v. වාචික සන්නිවේදනය සඳහාය

7) නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

i. අවිධිමත් සන්නිවේදන මූලාශ්‍රයක් ලෙස විහාරස්ථානය හැඳින්විය හැකිය.

ii. සන්නිවේදන ක්‍රියාවලියේ පදනම අන්තර්වර්ති සන්නිවේදනයයි.

iii. ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතිය රේඛීය බව පෙන්නුම් කරයි.

iv. ජනකතා නිර්මාණාත්මක සන්නිවේදනයට අයත් නොවේ.

v. විශ්ව ගම්මාන සංකල්පය මාෂල් මැක්ලූහන්ගේය.

8) සමූහ සන්නිවේදන අවස්ථාවක බාධාවක් නොවන්නේ

i. ග්‍රාහක කණ්ඩායම් කුස ගින්නේ සිටීම

ii. දේශනය ග්‍රාහක කණ්ඩායමට අදාළ නොවීම

iii. දේශනය අතරතුර වාහන නළා හඬ පැතිරීම.

iv. දේශකයා සරල බසක් භාවිතා කිරීම

v. දේශන ශාලාවේ විදුලි පංකා ක්‍රියාත්මක නොවීම.

9) විධිමත් හා අවිධිමත් සන්නිවේදනය යනු

i. සන්නිවේදන සංකල්පයකි. ii. සන්නිවේදන විධියකි

iii. සන්නිවේදන වර්ගීකරණයකි iv. සන්නිවේදන තලයකි

v. සන්නිවේදන ක්‍රියාවලියකි.

10) අන්තර්වර්ති සන්නිවේදනය යනු

i. දෙපියවර සංකල්පයකි.

ii. පුද්ගලයන්ගේ සහජාශයකි.

iii. එකම පුද්ගලයෙකු තුළ ඇති වන සන්නිවේදනයකි.

iv. අන්තර්වර්තය යනු අන්තර් පුද්ගල සන්නිවේදනයකි.

v. ස්වයං සංකල්පයකි.

11) තොරතුරු හුවමාරු ක්‍රියාවලිය තුළ දොරටුපාල සංකල්පය පවතී එය මඳවශයෙන් ක්‍රියාත්මක වන්නේ

i. පුවත්පත් කලාව තුළයි. ii. රාජ්‍ය මාධ්‍ය තළයි.

iii. අන්තර්ජාල හා ජංගම දුරකථනය තුළයි. iv. සාහිත්‍ය කෘති ප්‍රකාශනය තුළයි.

v. මාධ්‍ය නිවේදනය තුළයි.

12) වාරණය යන සංකල්පයට අදාළ වැරදි ප්‍රකාශය තෝරන්න.

i. ඕනෑම සංදේශයක් සම්ප්‍රේෂනය කිරීමේදී වාරණය දැකිය හැකිය.

ii. වාරණය යනු බහු විධ ක්‍රියාවලියකි.

iii. ගෘහය තුළ වාරණය ක්‍රියාත්මක වේ.

iv. අන්තර්ජාලය තුළ වාරණය ක්‍රියාත්මක නොවේ.

v. යුධමය අවස්ථාවකදී වාරණය අධික ලෙස ක්‍රියාත්මකවේ.

13) පහත සඳහන් ප්‍රකාශ අතරින් අනුපිළිවල අනුව නිවැරදි වන්නේ

A - ජනමාධ්‍ය වේදීන් සිය කාර්ය නිසිලෙස ඉටු නොකරන විට එය නිවැරදි කිරීමට රජය මැදිහත් විය හැකිය.

B - ජනමාධ්‍යවේදීන්ගේ කාර්ය විය යුත්තේ පාලක යන්ත්‍රය යහපත් ලෙස ක්‍රියාත්මක කිරීමට උදවු දීමයි.

C - නියෝග හා විධාන මගින් පාලන තන්ත්‍රයටඅවැසි ලෙස නියෝග දිය හැකිය

D - බොරුවක් මගින් ද ඇත්ත දැනගත හැකිය.

i. සමාජ වගකීම්, අධිපතිවාදී, ප්‍රජාතන්ත්‍රවාදී, සංවර්ධනය

ii. අධිපතිවාදී, නිදහස් මතවාදී, සෝවියට් කොමිනිස්ට්වාදී , සමාජ වගකීම්

iii. සමාජ වගකීම් , සෝවියට් කොමිනිස්ට්වාදී ,අධිපතිවාදී, නිදහස් මතවාදී

iv. නිදහස් මතවාදී, සමාජ වගකීම්, ප්‍රජාතන්ත්‍රවාදී, අධිපතිවාදී

v. අධිපතිවාදී, සමාජ වගකීම්, සෝවියට් කොමිනිස්ට්වාදී, නිදහස් මතවාදී

14) අන්තර්ජාලය තල ක්‍රියාත්මක ඇතැම් වෙබ් අඩවි අසභ්‍ය අශ්ලීල හා පුද්ගල ප්‍රතිරූප වලට හානි ගෙනදෙන වැඩසටහන් විකාශනය කරයිරජය පසුගිය දිනක එය තහනම් කිරීමට කටයුතු කළේය. මේ තුළ දැකගත හැක්කේ

i. අධිපතිවාදයේ ස්වභාවය ii. සමාජ වගකීම් සංකල්පයකි

iii. ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවලියකි. iv. නිදහස් මාධ්‍යට වැට බැඳීමකි.

v. මාධ්‍ය නිදහස අර්ථවත් කිරීමකි.

15) වර්තමාන සමාජය මාධ්‍ය පරිභෝජනය මුදල් වැය කිරීමකින් තොරව සිදුකරයි ඒ සඳහා ඉවහල් වන්නේ

i. ජනමාධ්‍ය අතර පවතින දැඩි තරගයයි. ii. මාධ්‍ය නිදහස උපරිම ලෙස ලබා දීමයි.

iii. දැන්වීම් කරණය හා ප්‍රචාරණයයි. iv. රාජ්‍ය මැදිහත් වීමයි.

v. ගෝලීය මාධ්‍ය පරිභෝජනයයි.

16) ජන සන්නිවේදනයේ දී ප්‍රතිපෝෂණය වැදගත් සන්නිවේදන අංගයකි. ඒ සඳහා අදාල නොවන ප්‍රකාශ ඇතුළත් වරණ තෝරන්න.

i. යම් කරුණක් පිලිබඳ මත විමර්ශනය කරමින් අදහස් දැක්වීම අදාල නොවේ.

ii. ග්‍රාහකයා හා සන්නිවේදකයා අතර අඛණ්ඩ සම්බන්ධතාවයක් ඇතිකර ගැනීමට ඉවහල් වේ.

iii. මේ තුලින් සංදේශයේ සාර්ථක අසාර්ථක බව දැනගත හැකිය.

iv. සංදේශය ග්‍රාහකයා නිසි අයුරින් අවබෝධකර ගත්තේ නැත්තම් නැවත සකස්කර ඉදිරිපත් කළ හැකිය.

v. සංදේශය ග්‍රාහකයා වෙත ලැබුනේද යන්න ස්ථිරව දැනගත හැකිය.

17) පහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි වරණය තෝරන්න.

A - ආකේතිකරණය යනු අදහස් සංකේත බවට පරිවර්තනය කර ඉදිරිපත් කිරීමයි.

B - වාර්ණ හා ආලෝක භාවිත කර සන්නිවේදනයේ යෙදිය හැකිය.

C - විධිමත් සන්නිවේදනය තුළ මූලාශ්‍රය පැහැදිලිය.

D - ශබ්ද තරංග හා ආලෝක තරංග කරණ කොට ගෙන ඇති වන උත්තේජනය හේතුවෙන් ප්‍රාග් වාචික ආවේගයන් ඇතිවීම තුළ විකේතය තේරුම් ගත හැකිය.

i. ඉහත ප්‍රකාශ සියල්ල සත්‍ය වේ.

ii. ඉහත ප්‍රකාශ සියල්ල අසත්‍ය වේ.

iii. A ,C සත්‍ය වන අතර B ,D අසත්‍ය වේ.

iv. A ,D සත්‍ය වන අතර B ,C අසත්‍ය වේ.

v. A පමණක් සත්‍ය වන අතර B ,C , D අසත්‍ය වේ.

18) පුවත්පත් සංස්කාරක වරයෙකුට ලැබුණු ලිපියක වැරදි අක්ෂර වින්‍යාසය සහිත වාක්‍ය කීපයක් දැකිය හැකිය. වැරදි අක්ෂර වින්‍යාසය සහිත වාක්‍ය තෝරන්න.

i. බදුල්ල බලා ධාවනය වූ ශීඝ්‍රගාමී දුම්රිය සුළු වේලාවක් ප්‍රමාද බව පාලක මැදිරිය පැවසීය

ii. අනතුරට පත් බවුසරය තුළ වහා ගිනි ගන්නා සුළු ඉන්ධන තිබූ බව හෙළිවිය.

iii. ඓතිහාසික ග්‍රන්ථ පරිශීලනයේදී විශිෂ්ට කෘති රාශියක් හමු විය.

iv. කැලණියේ කළු පාලම ප්‍රතිසංස්කරනය සීඝ්‍රයෙන් සිදුකෙරේ.

v. භාණ්ඩාගාර ලේකම්වරයාගේ වාර්තාව සදොස් බව මාධ්‍ය වේදීහු ප්‍රකාශ කළහ.

19) එකම රූපවාහිනී නාලිකාවක වැඩසටහන් නැරඹීම එකම ගුවන් විදුලි නාලිකාවකට සවන් දීම නිතර එකම පුවත් පතක් මිලදී ගැනීම තුළ දැකගත හැක්කේ

i. විශේෂිකරණය

ii. ඒකාකෘති කරණය.

iii. ප්‍රතිරූප නිර්මාණයයි.

iv. සංස්කෘතික කරණයයි.

v. ජනමාධ්‍ය බලපෑමයි.

20) ජනමාධ්‍ය සංදේශයට අදාල ප්‍රකාශයන් කිහිපයක් පහත දැක්වේ.

A - නිශ්චල ඡායාරූප යනු චංචල ලෝකය මොහොතකට නවතා තැබිය හැකි මාධ්‍යයකි.

B - නිර්මාණශීලීත්වය යනු සුලභ දේ තුළ දුලභ දේ දැකීමයි.

C - දෘෂ්ටියේ අඛණ්ඩතාව සිනමාවට අදාල ප්‍රකාශයකි.

D - ආලෝකයෙන් ඇඳීම යනු ඡායාරූප කලාවයි.

E - ගුවන් විදුලිය සඳහා පැහැදිලි භාෂාවක් අවශ්‍ය වේ.

i. A ,B සත්‍ය වන අතර C ,D ,E අසත්‍ය වේ.

ii. B,D සත්‍ය වන අතර A,C,E අසත්‍ය වේ.

iii. ඉහත ප්‍රකාශ සියල්ල සාවද්‍ය වේ.

iv. ඉහත ප්‍රකාශ සියල්ල නිරවද්‍ය වේ.

v. A ,C ,D අසත්‍ය වන අතර B ,E සත්‍ය වේ.

## II කොටස

**ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

**එක් ප්‍රශ්නයකට ලකුණු 20 කි.**

(1) සන්නිවේදන ක්‍රියාවලිය සුමට ලෙස ක්‍රියාත්මක වන්නේ ආකෘති මගිනි. පහත ප්‍රකාශ ආකෘතියක අංගයකට ඇතුළත් කළහොත්

**පහත ප්‍රකාශය ඉදිරියෙන් අදාළ අංකය නම් කරන්න.**

i. * කිසියම් සිදුවීමක් අමල්ගේ පසිඳුරන් මගින් ඔහු තුළ කිසියම් උත්තේජනයක් ඇති කරයි. ____________________

ii. * ස්නායුමය සංඥා මගින් අමල්ගේ මොළයට ගමන් කර ආකෘතියක් ඇති කරන අතර ප්‍රාග්වාචික ආවේගයක් ජනිත වී වචනයට නැගීම ආරම්භ කරයි.

____________________

iii. * ඔහු තමාට අභිමත වචන තෝරා කිසියම් ක්‍රමයකට සන්නිවේදනය කරයි.

____________________

iv. * ශබ්ද තරංග හා ආලෝක තරංග මගින් අමල් තරංගට කතා කරයි.

____________________

v. * ශබ්ද තරංග හා ආලෝක තරංග වලට බාධා පැමිණේ.____________________

vi. * එම තරංග මගින් කමල් තුළ උත්තේජනයක් හටගෙන ප්‍රාග් වාචික ආවේගයක් හට ගනී. ____________________

vii. * කමල් තුළ ආතතියක් හටගෙන හුරුපුරුදු රටාවකට අනුව ආවේගය වචනයට නගයි. ____________________

viii. * ඔහු අභිමත වචන තෝරා අමල්ට කතාකරන අතර අමල් කමල්ට සංදේශය ලැබුනු බව දැනගනී. ____________________

(2)

i. සන්නිවේදනය පිළිබඳ විල්බර් ශ්‍රාම්ගේ හෝ ලැස්වෙල්ගේ නිර්වචනය ඉදිරිපත් කරන්න.

ii. ජ්‍යාත්‍යන්තර භාෂාව ලෙස හැඳින්විය හැක්කේ නිර්වාචික සන්නිවේදනයයි. එහි විවිධ ස්වභාවයන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

iii. සන්නිවේදන ස්වභාවය කෙටියෙන් හඳුන්වා එක් අංගයක් විස්තර කරන්න.

iv. අධිපතිවාදී සන්නිවේදනයේ ස්වභාවය කෙටියෙන් පැහැදිලි කරන්න.

(3) මානවයා මෙන්ම සත්තු ද සන්නිවේදනයේ යෙදෙති.

i. සත්තු සන්නිවේදනය කරන්නනේ කුමන අරමුණු සඳහාද උදාහරණ 04 ක් දෙන්න.

ii. සත්තු සන්නිවේදනය කරන ආකාරය උදාහරණ 03 ක් ඔස්සේ පැහැදිලි කරන්න.

iii. මානව සන්නිවේදනය සත්ව සන්නිවේදනයෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න.

iv. අන්තර්වර්ති සන්නිවේදනය කෙටියෙන් පැහැදිලි කරන්න.

(4) සන්නිවේදන වර්ගීකරණය හඳුන්වන්න.

i. ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

ii. මුද්‍රණය බිහිවීමට පෙර මානවයා ලේඛනය භාවිතා කළ ආකාරය පැහැදිලි කරන්න.

iii. ජන සන්නිවේදනයේ මූලික ලක්ෂණ 04 ක් හඳුන්වන්න.

iv. අවිධිමත් සන්නිවේදනය විධිමත් කළමණාකරණ කටයුතක් සඳහා යොදාගත හැකිය පැහැදිලි කරන්න.

(5) මානව සමාජය අධ්‍යනය කිරීමේදී සන්නිවේදනය වැදගත්වෙයි.

i. සමාජය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. සමාජයේ විකාශනය පැහැදිලි කරන්න.

iii. සමාජයක් පැවතීම සඳහා අවශ්‍ය වන සාධක නම් කරන්න.

iv. භාෂාවේ විකාශනය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(6) i. ඔබ කැමති සන්නිවේදන ආකෘතියක් නම් කර එහි අවස්ථා සඳහා පණිවිඩයක් සකස් කරන්න.

ii. අවිධිමත් සන්නිවේදනය යනු කුමක්දැයි හඳුන්වා එහි ද්‍රාම සටහනකින් දක්වන්න.

iii. වර්තමානයේ භාවිතා වන දෘශ්‍ය සන්නිවේදන ස්වරූපය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

iv. වාචික සන්නිවේදනය යොද ගත හැකි ආකාරයන් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.